
# පොරි සීයට හිනාවක්



අර්.එම්. යුවිනි සහස්නා වීරකෝන්

# පොරි සීයට හිනාවක්

අර්.එම්. යුවිනි සහස්නා වීරකෝන්

# පොර් සීයට හිනාවක්

කතා ප්‍රකාශනයකි

ආර්.එම්.යුවිනි සහස්නා වීරකෝන්

1 ශ්‍රේණිය C

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

පළමු දිග හැරුම 2025.02.08

ISBN- 978 - 624 - 208 - 639 - 2

# පිදුම

ආදරණීය
විදුහල්පතිතුමියටත්
1 ශ්‍රේණිය C පංතිභාර
ගුරු මෑණියන්ටත්
මගෙ ආදරණීය
අම්මා, අප්පච්චි සහ
අයියාටත්
සෙනෙහසින්
පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵළයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.


.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ලස්සන පුංචි යුවී හිටියේ ලස්සන නගරයක. මේ නගරය තිබුණේ කඳු වළල්ලකට මැද තවත් කන්දක් මුදුනේ. ඒ නගරයේ ලොකු පන්සලක් තිබුණා. ඒ පන්සලට යන පාරේ ලොකු වැවක් තිබුණා. වැව වටේට ලොකු ගස් තිබුණා. මේ වැවේ මාළුවෝ පිරිලා. ඕලු , නෙළුම් , මානෙල් මල් පිපුණු වැව හරිම ලස්සනයි.


කොක්කු තාරාවෝ හංසයෝ නිතරම වැවේ හිටිය නිසා වැව තවත් ලස්සනයි.



vertical


වැව වටේ තියෙන ලොකු ගස් යට
සෙවණේ මල්, හඳුන්කූරු, තිර
පොල්තෙල් වගේම කැලෙන් හොයා
ගන්න මල් පැළ, අඹ,
අන්නාසි, පේර, වෙරළු ,
පොරි විකුණන වෙළෙන්දෝ හිටියා.

පුංචි යුවීගේ පාසල තිබුණේ වැව ළඟ. යුවී හැමදාම පාසල් යන්නේ පයින්. එහෙම යනකොට වැවේ මාළුවෝ පීනනවා බලන්න, මල් බලන්න, වැවේ වතුර සුළඟට හෙළවෙනවා බලන්න යුවී හරි ආසයි. හැමදාම වැව ළඟින් යන එන යුවීට පොරි විකුණන සීයා කෙනෙක් හිනා වෙනවා. අත වනනවා. පුංචි යුවීත් පේන තරම් දුර අත වන වනා යනවා. පුංචි යුවීගේ යාළුවෝ නම් කවදාවත් අත වැනුවෙත් නැ . බැලුවෙත් නෑ . ඒකට නම් යුවී ට හරිම දුකයි.



දවසක් යුවී අම්මත් එක්ක ගෙදරට ඕනි බඩු ගන්න නගරයට ගියා. එයාලා බඩු අරගෙන එනකොට ගොඩක් හවස් වුණා. නගරයේ කඩයක් ළඟ බිම රෙදි එලාගෙන නිදාගන්න ලෑස්ති කරන සීයා කෙනෙක් දැක්කා. පුංචි යුවීට හරියට දුක හිතුණා.

“අම්මේ ඒ අර පොරි සීයා නේද?”

පුංචි යුවී ඇහුවා.

“ඔව් නේද පුතේ. ඒ සීයා තමයි”


අම්මා කිව්වා

ගෙදර එනකම් පුංචි යුවී අම්මගෙන් ගොඩක් දේ ඇහුවා.





ගෙදර ඇවිත් යුවී හිතුවේ සීයා ගැනමයි. එයා නිදා ගන්න ගියෙත් හරිම දුකෙන්. එයාට ගෙදරක් නැද්ද?. එයාට කවුරුත් නැද්ද...... ? ඔය වගේ ගොඩක් දේ පුංචි යුවී අම්මාගෙන් ඇහුවා.



යුවී පහුවදා උදේම
කල්පනා කළා
කොහොමද සීයාව
සතුටු කරන්නේ
කියලා.

යුවී දුවගෙන ගිහින් අම්මට ලොකු කතාවක් කිව්වා.

"අම්මේ ළඟ එන මගේ උපන් දිනයට සීයට තෑග්ගක් දෙමුද....?


මට තෑගි එපා... ඒ සල්ලි වලින් සීයට තෑගි දෙමුකෝ..."

අනේ අම්මේ.... " යුවී උඩ පැන පැන අම්මට කිව්වා.

අම්මට හරිම සතුටු හිතුණා.

"මේ මගෙ හොඳ දුව. අසරණ අයට පිහිට වෙන එක කොයි තරම් හොඳද?...."

අම්මා යුවී ව තුරුළු කර ගත්තා.





පුංචි යුවී ගේ උපන් දිනය දවස උදා වුණා. අම්මයි යුවියි කලින් ලෑස්ති කරගත්ත දේවල් සූදානම් කරගත්තා. අම්මා සීයාටත් කෑම හැදුවා.




අද වෙදාටත් වඩා ලස්සන දවසක්
කියලා යුවී බබා ට හිතුණා.
එයා සූදානම් කරගත් තෑගි,
කෑම අරගෙන කලින් ම
ගෙදරින්
පිටත් වුණා.

යුවී යනකොට සීයා කලින් ම ඇවිත්, එයාගේ පොරි මල්ලත් තියාගෙන ඉන්නවා.


යුවී සීයා ළඟට ගිහින් සරමකුයි, කමිසයකුයි ඔතපු තෑග්ග දුන්නා. තව කෑම ජාති ගොඩක් ඔතලා තිබුණු අනිත් තෑග්ගත් දුන්නා. අම්මා රසට හදපු බත් එකත් පුංචි යුවී දුන්නා. සීයට හිතා ගන්න බැරි වුණා. එයාගේ ඇස්වලට කඳුළු ආවා.

"අනේ පුතේ මට මෙහෙම තෑගි ලැබිලම නෑ..... චූටි පුතාට ගොඩක් ස්තුතියි"

සීයා කඳුළු පිහිදාන ගමන් කිව්වා.


පොත්

සීයට හරිම සතුටුයි. සීයා යුවීට
පොරි ගොටුවක් දුන්නා. යුවීටත්
ගොඩක් සතුටුයි.
"ස්තුතියි සීයේ" පුංචි යුවී කිව්වා.
පොරි ගොටුව අරගෙන යුවී
මාළුවන්ට දැම්මා. අද යුවී හරිම
සතුටින්.
"අම්මේ මම අද තමයි පොරි සීයා
හොඳටම හිනා වෙනවා දැක්කේ"
පුංචි යුවී කිව්වා
"තමන්ට ලැබෙන දෙය තවත්
අසරණ කෙනෙකුට දෙන්න
හැමෝටම බෑ. හොඳ හිතක්
තියෙන හොඳ දුවෙක් ඔයා"
අම්මා යුවී සතුටින් තුරුළු කර
ගත්තා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්